ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE

මගේ අංකය / எனது இல. / My Ref. CSS/09/01/22 — ඔබේ අංකය / உனது இல / Your Ref. — දිනය / திகதி / Date 2020.11. 02

දකුණු පළාත් ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (ගිණුම් හා ගෙවීම්) 01/2020

දකුණු පළාත් සභාවේ සියළුම
ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්, ගණන් දීමේ නිලධාරීන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ප්‍රඥප්තිගත ආයතනවල ප්‍රධානීන්,

**දකුණු පළාත් සභාවට අයත් ආයතනවල අවසාන ගිණුම් සඳහා පිරිසිදු විගණන මතයක් ලබා ගැනීම පිළිබඳව 2020.10.08 දින ප්‍රධාන ලේකම් කාර්යාලයේදී පැවති රැස්වීමේදී එළඹෙන ලද තීරණ ක්‍රියාත්මක කිරීම.**

දකුණු පළාත් සභාවේ ආයතනවල දැනට පවතින ගිණුම්කරණ අඩුපාඩු අවම කර, අවසාන ගිණුම් සඳහා පිරිසිදු විගණන මතයක් ලබාගැනීම සම්බන්ධව 2020.10.08 දින ගණකාධිකාරීවරුන් සමඟ පැවති රැස්වීමේදී එළැඹි තීරණ පහත සඳහන් කරමි. මෙහි සඳහන් තීරණයන් ඔබ ආයතනය තුළ ක්‍රියාත්මක කළ යුතු බව කාරුණිකව දන්වමි.

01. 2020 ඔක්තෝබර් මස සිට සෑම ශීර්ෂයකම මාසික ගිණුම් සාරාංශ ඊළඟ මාසයේ 02 දිනට පෙර ඉදිරිපත් කළ යුතුය.
02. ගිණුම් වාර්තා කිරීම සඳහා 2021.01.01 දින සිට New CIGAS පරිගණක වැඩසටහන ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.
03. මාසික ගිණුම් සැසඳීම් වාර්තාව අදාළ මාසයට පසු මාසයේ 30 දිනට ප්‍රථම එවිය යුතුය.

04. කොම්ප්ට්‍රෝලර් ජනරාල්ගේ චක්‍රලේඛ සහ දකුණු පළාත් වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අනුව සියළුම ආයතනවල ස්ථාවර වත්කම් ගිණුම්ගත කිරීමේ කටයුතු 2020.12.31 දින වන විට අවසන් කළ යුතුය. සියළුම අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/ පළාත් පාලන ආයතන/ පාසල් /කලාප අධ්‍යාපන කාර්යාල / අනෙකුත් සියළුම උප කාර්යාලවලටද මෙය අදාළ වේ.

05. සෑම ආයතනයක්ම මාසික බැංකු සැසඳුම් ඊළඟ මාසයේ 15 දිනට විගණකාධිපතිට යැවිය යුතු අතර, එහි පිටපතක් ගිණුම් හා ගෙවීම් දෙපාර්තමේන්තුවටද එවිය යුතුය.

06. දැනට අත්තිකාරම් ගිණුම්වල පවතින ණයගැති/ ණයහිමි ශේෂයන් (පළාත තුළ/ අන්තර් පළාත් සහ මධ්‍ය රජය සමඟ පවතින ණය ශේෂයන්) අදාළ චක්‍රලේඛවලට අනුකූලව කඩිනමින් පියවා ගැනීමට කටයුතු කළ යුතුය.

ආර්. සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2232343 | කාර්යාලය / காரியாலயம் / Office 091 4119010, 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.
"විශිෂ්ටත්වයෙන් 1 ට එන යහපාලනයක්"